කාර්‍යක්ෂමතාවය අතින් දියුණු වීමට දේශීය කර්මාන්තවලට අපහසු විය. එමෙන්ම, විදේශීය වෙළෙඳපොලවල ඉඩකඩ ලබාගැනීම සම්බන්ධයෙන්ද මැනවින් දන්නා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවිය. මේ අනුව සලකන කල, 1977 අය වැය කථාවෙහි යෝජනා කරන ලද පරිදි, නිදහස් ආනයන වැඩපිළිවෙල මගින් බොහෝ අමුද්‍රව්‍ය ආනයන පිළිබඳ පැවති බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීම සහ රුපියල් 7,00,000 ට වැඩි නොවන යන්ත්‍ර සූත්‍ර රජයේ පූර්ව අනුමැතියක් රහිතව ආනයනය කිරීමට ඉඩදීම වැනි ප්‍රතිපත්ති, මීට ඉහතදී පැවති ප්‍රතිපත්තිවලට වඩා විශාල වෙනස්කමකින් යුක්ත බව කිව හැක. තවද, මෑතකදී පිහිටවූ මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති කෙරෙන අපනයන ද්‍රව්‍ය සකස් කිරීමේ කලාපය මගින්, අපනයනය කෙරෙහි යොමු වූ කර්මාන්ත වඩා නිදහස් වාතාවරණයක් තුළ දියුණු කිරීමට ඉඩකඩ සැලසෙනු ඇත. මෙකී යෝජනා තුළින් වඩා සීඝ්‍ර වර්ධනයක් කර්මාන්ත ක්ෂෙත්‍රයෙහි ඇතිවේයයි බලාපොරොත්තු වේ. සමස්තයක් ලෙස ගත්කල, 1977 දී පෙනීගියේ ආනයන ආදේශනය මත පදනම් වූ කර්මාන්ත ක්‍රමයක් අපනයනය මුල් කරගත් කර්මාන්ත සංවර්ධනය සඳහා යොමු කෙරෙන අන්දමින් මෙරට කර්මාන්ත ප්‍රතිපත්තියේ ඇතිවූ මූලික වෙනසකි.

## මිල

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමෙහි ඇතිවන වෙනස්කම් මැනීම සඳහා මෙතෙක් භාවිතා කරනු ලැබූ එකම දර්ශකය වූ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය අනුව 1977 වර්ෂය තුල මිල මට්ටම සියයට 1·2 කින් වැඩිවී ඇත. මෙම දර්ශකය අනුව 1976 වර්ෂයේ දී ද මිල මට්ටමේ වර්ධනය සියයට 1·2 ක් වූ අතර 1975 දී එය සියයට 6·7 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ පසුගිය වාර්ෂික වාර්තාවල සඳහන් කළ පරිදි කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ පවතින දැඩි ඌනතාවන් නිසා එය ආර්ථිකයේ මිල මට්ටමේ වෙනස්වීම් මැනීමට සුදුසු මිණුමක් නොවේ.

මිල මට්ටමෙහි වෙනස්වීම් මැනීම සඳහා වඩා තාත්වික දර්ශකයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 1974 පාද වර්ෂය වශයෙන් යොද ගනිමින් 1977 දී තොග මිල දර්ශකයක් ගණනය කරන ලදී. මෙම මිල දර්ශකය පාරිභෝගික මට්ටමේදී ඇතිවන මිල වෙනස්වීම් මැනීමක් නොකළත් පාරිභෝගික මිල දර්ශකයට වඩා මිල මට්ටමේ වෙනස්වීම් තක්සේරු කිරීම සඳහා යෝග්‍ය වේ. පාරිභෝගික මිල දර්ශකයෙන් පෙන්නුම් කරන ලද 1977 වර්ෂයේ මිල මට්ටමේ වැඩිවීම වූ සියයට 1·2 සමග සසඳන විට තොග මිල දර්ශකය සියයට 31 ක වැඩිවීමක් දක්වයි. 1976 දී තොග මිල දර්ශකයේ වැඩිවීම සියයට 8 ක් වූ අතර එය 1975 දී සියයට 3 ක් විය. අනෙක් අතට වර්තන මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සහ 1959 යේ ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය අතර අනුපාතිකය වූ ගම්‍ය මිල දර්ශකය 1977 වර්ෂය තුල සියයට 16 ක ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. මෙය 1976 දී සියයට 7 ක්ව පැවැති අතර 1975 දී සියයට 8 ක්ව පැවතිණි. තොග මිල දර්ශකය හා ගම්‍ය මිල දර්ශකය නිර්යාත මිල සඳහා වැඩි බර තැබීමක් කරන අතර නිර්යාත මිල ගණන් 1977 වර්ෂයේ දී සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ බව සඳහන් කිරීම වැදගත් වේ. එහෙයින් පාරිභෝගික මිල මට්ටමේ ඇතිවන වෙනස්කම් මැනීම සඳහා මෙවැනි දර්ශකයන් උපයෝගී කරගන්නේ නම් අපනයන මිල සඳහා ඇති වැඩිවීමක් දක්වන අභිනතිය වට්ටම් කළයුතු වේ. සමස්තයක් ලෙස සලකන විට 1977 වර්ෂය තුල පාරිභෝගික මිල සියයට 12 සිට 15 දක්වා වූ ප්‍රමාණය කින් ඉහළ ගිය බව තක්සේරු කිරීම සාධාරණ වේ.

ඉහතින් සඳහන් කළ 1977 වර්ෂය සඳහා වූ මිල මට්ටමේ වෙනස්වීම් අධ්‍යයනය කිරීමේදී වර්ෂය තුල මුදල් සැපයුමේ සියයට 29 ක වර්ධනයත් සියයට 23 ක් වූ ආනයන මිල දර්ශකයේ වැඩිවීමත් සියයට 9 ක් වූ මූල්‍ය වැටුප් මට්ටමේ ඉහල යාමත් සැළකිල්ලට භාජනය කළ යුතුය. තවද පොලී ප්‍රමාණයේ සාමාන්‍ය වැඩිවීම සහ 1977 නොවැම්බර් මාසයේ දී ලංකා රුපියල පාවෙන්නට ඉඩ හැරීමෙන් අවසාන වූ අගෝස්තු මස සිට ක්‍රමානුකූලව මුදලේ වටිනාකම අවප්‍රමාණය වීම ද මිල මට්ටම කෙරෙහි බලපා තිබේ. ශ්‍රී ලංකා රුපියල සඳහා ඇති කළ ඒකීය විනිමය අනුපාතික ක්‍රමයේත්, නිදහස් වෙළඳ ක්‍රමයේත් මිල කෙරෙහි ඇතිවූ

කෙටිකාලීන බලපෑම් ද මිල මට්ටම ඉහළ යාමට තුඩුදී ඇත. නිදහස් වෙළඳ ක්‍රමයක් මඟින් සිදුවිය හැකි ආනයනයන්ගේ සැලකිය යුතු වැඩිවීමටත්, දේශීය නිෂ්පාදන ධාරිතාවේ පුනර් - ජීවනයක් ඇතිවීමටත් සෑහෙන කලක් ගතවන හෙයින් කෙටිකාලයේ දී මිල මට්ටම මෙසේ ඉහල යාම බලාපොරොත්තු වියහැකි දෙයකි. එහෙයින් 1977 අවසාන භාගයේ දී කරන ලද ප්‍රතිසංස්කරණයන්ගේ ප්‍රතිඵල නිසා මිළ මට්ටමේ සැකසීමක් බලාපොරොත්තු විය හැක්කේ ඉදිරි වර්ෂයේ දීය.

1977 වර්ෂයේ දී තොග මිල දර්ශකය ඉහල යාමට මූලිකව හේතු වූයේ ආහාර (සියයට 42 කින්), රෙදිපිළි හා පාවහන් (සියයට 40කින්), ඉන්ධන සහ එළිය (සියයට 35 කින්) ලෝහමය නොවන නිෂ්පාදිත (සියයට 25 කින්), මධ්‍යසාර (සියයට 7 කින්), කඩදසි නිෂ්පාදන (සියයට 4 කින්), යන්ත්‍රෝපකරණ (සියයට 6 කින්), ප්‍රවාහන උපකරණ (සියයට 7 කින්) සහ විවිධ භාණ්ඩ (සියයට 14 කින්) යනාදියේ මිළ ගණන් වැඩිවීමය. අනික් අතට රසායනික නිෂ්පාදන සියයට 27 කින් ද,ඛනිජ තෙල් නිෂ්පාදන සියයට 2 කින් සහ ලෝහ නිෂ්පාදන සියයට 2කින් ද මිල පහත බැසීමක් පෙන්වනු ලැබේ.

බෙහෙවින් භාවිතා කරනු ලබන පාරිභෝගික භාණ්ඩවල සැපයීම විධිමත් කිරීමේ ක්‍රමයක් වශයෙන් භාණ්ඩ විශාල ප්‍රමාණයක් සඳහා සලාක හා මිල පාලන ක්‍රමයක් 1977 වර්ෂයේ වැඩි කාල පරිච්ඡේදයක් සඳහා ක්‍රියාත්මක විණි. වර්ෂය තුලදී මිල පාලනය යටතට අළුතින් ගෙනෙනු ලැබූ එකම භාණ්ඩ වර්ගය ඖෂධ වර්ග පමණි. සීනි, තිරිඟු පිටි, පාන්, භූමිතෙල් සහ තීන්ත වර්ග වල පාලන මිල අඩු කරන ලද අතර වීදුරු තහඩු වල සහ විදුලි බුබුළු වල පාලන මිල වැඩි කරන ලදී. එහෙත් අයවැය දේශනයෙන් යෝජිත නිදහස් ආර්ථිකයක් ඇති කිරීමේ ප්‍රතිපත්තිය අනුව 1977 නොවැම්බර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සීනි, තිරිඟු පිටි, පාන්, කඩල පරිප්පු, කොත්තමල්ලි, හරක්මස්, එළුමස් සහ කිරි ආහාර හැර අනෙක් සියලු භාණ්ඩ සඳහා මිල පාලනයන් ඉවත් කරන ලදී.

ගෙවුම් ශේෂය කෙරෙහි දිගු කාලීන වශයෙන් හිතකර නොවූවත් වැඩෙන උද්ධමනකාරී තත්ත්වය යම් ප්‍රමාණයකින් මැඩලීමේ අභිලාෂයෙන් රජය 1977 මාර්තු මාසයේ දී ලංකා රුපියල සියයට 20 කින් පමණ අධිප්‍රමාණය කරන ලදී. එහෙත් මිල මට්ටම පහත වැටීමක් සිදු නොවූයෙන් සියයට 10 කින් පමණ මිල අඩු කරන ලෙස දේශීය නිෂ්පාදකයින්ට අණ කෙරෙන පරිපාලනමය බලපෑම් ඇති කිරීමට සිදුවිය. නමුත් මෙම ව්‍යායාමය අසාර්ථක බව පැහැදිලි වූයෙන් 1977 අගෝස්තු මාසයේදී නව රජය විසින් ගන්නා ලද තීරණයක් අනුව ශ්‍රී ලංකා රුපියල එහි සත්‍ය විදේශීය අගය දක්වන පරිදි ක්‍රමානුකූලව අවප්‍රමාණය වීමට ඉඩ හරින ලදී.

## වැටුප්

1977 මුල් කාර්තු තුනේදී රාජ්‍යාංශයේ සේවකයන්ගේ වැටුප් සහ වේතන නොවෙනස්ව පැවතිණි. නොවැම්බර් මාසයේ දී අයවැය යෝජනා අනුව 1977 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාමිකයින් ද ඇතුළුව සියළු රාජ්‍ය සේවකයින්ගේ වැටුප් මසකට රුපි. 50/- ක උපරිමයකට යටත්ව සියයට 25 කින් වැඩි කරන ලදී. 1976 ජනවාරි මාසයේ සිදුවූ අවසාන වැටුප් වැඩිකිරීමේ දී මෙන් මෙම වැටුප් වැඩිකිරීමද රජයේ දෛනික වැටුප් ලබන සේවකයන්ටත්, රාජ්‍යාංශයේ වතු කම්කරුවන් ඇතුළු රාජ්‍ය සංස්ථා සේවකයන්ටත්, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවකයන්ටත්, වැටුප් පාලක මණ්ඩල වලින් ආවරණය කරනු ලැබූ සේවකයන්ටත් බලපාන අයුරින් ක්‍රියාත්මක කෙරිණි.

ඉහත සඳහන් වැටුප් සංශෝධනය නිසා පාසැල් ගුරුවරුන් හැර අනෙක් සියළු රාජ්‍ය සේවකයන්ගේ අවම වැටුප 1977 අවසානය වන විට සියයට 5·3 කින් වැඩි විය. පාසැල් ගුරුවරුන්ගේ වැටුප සියයට 3·8 කින් වැඩි වූ අතර, සුළු සේවකයන්ගේ වැටුප සියයට 5·9 කින් වැඩි විය. තවද කාර්මික හා ලිපිකාර සේවකයන්ගේ වැටුප් සියයට 4·4 කින් වැඩි විය. පසුගිය වර්ෂයේ සියයට 2·2 ක වැඩිවීමක් හා සැසඳීමේ දී 1977 දී කෘෂිකාර්මික